
# වාර්ෂික අයවැය වාර්තාව
# ANNUAL BUDGET REPORT
# ஆண்ட, வரவுச லெவுதிட்டம்
# 2023




ප්‍රාදේශීය සභාව - මීගහකිවුල

PRADESHIYA SABHA - MEEGAHAKIULA

மீகஹகிவுல பிரதேச சபை

055 22 45 775

meegahakiulaps@gmail.com

# අන්තර්ගතය


**01**

පූර්විකාව

01.1. සභාවේ දැක්ම හා මෙහෙවර ප්‍රකාශය..........................................01

01.2. සභාවේ ආරම්භය හා මේ දක්වා ව්‍යාප්තිය..................................02-03

**02**

විධායක සාරාංශය

02.1. ගරු සභාපතිතුමාගේ අයවැය පණිවිඩය............................................05

02.2. ලේකම්තුමාගේ අයවැය පණිවිඩය.....................................................06

02.3. ගරු සභාපතිතුමාගේ අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශය..........................07-08

02.4. වර්තමාන සභාපතිතුමා හා මන්ත්‍රී මණ්ඩලය.......................................09

**03**

අප පිළිබඳව

03.1. පොදු තොරතුරු..............................................................................11-13

03.2. බල ප්‍රදේශයේ සිතියම............. ...................................................14

03.3. සංවිධාන සටහන.................................................................................15

03.4. මිනිස් බල සාරාංශය.......................................................................16-17

**04**

2023 වර්ෂයේ අයවැය

04.1. ආදායම් හා වියදම් පසුගිය වර්ෂ දෙක සමග සංසන්දනය................19-22

04.2. පුනරාවර්ථන /ප්‍රාග්ධන/ ආදායම් සාරාංශ...........................................23

04.3. පුනරාවර්ථන /ප්‍රාග්ධන ආදායම් සාරාංශය වට ප්‍රස්තාර.......................24

04.4. පුනරාවර්ථන /ප්‍රාග්ධන/ වියදම් සාරාංශ..........................................25

04.5. පුනරාවර්ථන /ප්‍රාග්ධන වියදම් සාරාංශය වට ප්‍රස්තාර.........................26

04.6. පුනරාවර්ථන ආදායම් වියදම්/ ප්‍රාග්ධන ආදායම් වියදම් ඇතුළු අතිරික්තය/ඌණතාවය පෙන්වනු ලබන සාරාංශය.................................

04.7. අය වැය වාර්තාව.......................................................................27-39

04.8. අය වැය වර්ෂයට ඇස්තමේන්තු සකසන ආකාරය පිළිබඳව හැදින්වීම..................................................................40-52

04.9.අයවැය සම්මත කිරීම් ලිපිය...........................................................53

# 01

# පූර්විකාව

01.1. සභාවේ දැක්ම හා මෙහෙවර ප්‍රකාශය……......................................01
01.2. සභාවේ ආරම්භය හා මේ දක්වා ව්‍යාප්තිය....................................02-03

# දැක්ම

"අභිමානවත් පුරවරයක්"

# මෙහෙවර

"පළාත් පාලන නීතිය තුළ ක්‍රියා කරමින්, මීගහකිවුල ප්‍රාදේශිය
සභා බල ප්‍රදේශය තුළ මහජන සෞඛ්‍ය පොදු මංමාවත් හා
මහජන උපයෝගිතා සේවාවන් ප්‍රශස්ථ මට්ටමින්
පවත්වාගෙන යාම සඳහා ප්‍රදේශයේ සියලුම සම්පත්
කාර්යක්ෂමව හා ඵලදායිව යොදාගනිමින්,
ජනතාවගේ තිරසාර ,සමාජ ආර්ථික ,සංස්කෘතික සංවර්ධන
අභිමතාර්ථ සහතික කිරීම උදෙසා
සියලු දෙනාගේ සහභාගිත්ව ප්‍රවේශයක් තුළ පාරිසරික
සංවේදිතාවයෙන් යුතුව කැපවීම
අපගේ මෙහෙවරයි."

# මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ ආරම්භය සහ මේ දක්වා ව්‍යාප්තිය කෙටියෙන්

ශ්‍රී ලංකාවේ පළාත් වර්ගීකරණයට අනුව ඌව පළාත අනෙකුත් පළාත් හා සමගාමීව ප්‍රමුඛ ගණයේ ලා සැලකේ. ඌව පළාත , බදුල්ල හා මොණරාගල වශයෙන් පරිපාලන දිස්ත්‍රික්ක 02 ක කින් සමන්විත වේ. බදුල්ල දිස්ත්‍රික්කය තුල පිහිටා ඇති මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ග්‍රාම නිළධාරි වසම් 20 කින් සමන්විත වන අතර , වර්ග කිලෝ මීටර් 105Km$^2$ ක වපසරියකින් යුක්ත වේ.

ඌව පළාතේ ප්‍රධාන පරිපාලන නගරය වන බදුල්ල නගරයේ සිට 23 KM ක දුරින් මීගහකිවුල ප්‍රාදේශීය සභාව පිහිටා ඇති අතර, බදුල්ල මහියංගණ හා බදුල්ල මහනුවර ප්‍රධාන මාර්ගයේ තල්දෙන 10 වෙනි සැතපුම් කණුව සිට කරමැටිය දක්වාත්, නැගෙනහිරින් පිටමාරුව රෝබේරිය දක්වාත්, දකුණු දෙසින් මොරහෙල කැටවත්ත දක්වාත් මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය පිහිටා ඇත.

බල ප්‍රදේශයේ ජනගහනය තුල සිංහල, දෙමළ, මුස්ලිම්, යන ප්‍රධාන ජන කොටස් ජීවත්වන අතර, මුළු ජනගහනය වන 25,122 න් ග්‍රාමීය ජනගහණය 22,550 ක් සහ වතු ජනතාව 2,572 කින් සමන්විත වේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය අනුව ජන වර්ගය අනුව ජනගහන ප්‍රතිශතයන් සිංහල 89.62%, ශ්‍රී ලංකා දෙමළ, 10.03%, ඉන්දියන් දෙමළ 0.00%, ශ්‍රී ලංකා යෝනක 0.06% හා වෙනත් 0.27% වේ. (මූලාශ්‍රය 2021, මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්පත් පැතිකඩ වාර්තාවට අනුව)

කෘෂි කර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය මාර්ගය කර ගත් මීගහකිවුල බල ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රධාන ආදායම් මාර්ගය වී වගාව හා හේන් වගාවයි. වී වගාවට අමතරව බඩ ඉරිඟු වගාවට ප්‍රධාන ආර්ථික බෝගය ලෙස තේ වගාව සිදුවේ. ප්‍රදේශයේ භූමි ප්‍රමාණයෙන් සැළකිය යුතු ප්‍රමාණයක ගෙවතු වගාව දක්නට ලැබෙන අතර, කෝපි, ගම්මිරිස්, පුවක් ,පොල් කුරක්කන් , තල , මුං , එළවළු හා පළතුරු වගා කිරීම සුළු පරිමාණයෙන් සිදුවේ. ප්‍රධාන ආර්ථික කටයුතු වලට අමතරව ස්වං රැකියා වශයෙන් , සත්ව පාළනයද බහුල වශයෙන් සිදු වන අතර, ගව පාළනය , කුකුල් පාලනය තුලින් , ආදායම් උපයා ගැනීමේ මාර්ග ද ප්‍රදේශයේ දක්නට ලැබේ.

අධ්‍යාපන හා පොදු පහසුකම් ගත් විට රජයේ පාසැල් 22 ක් හා පෙර පාසැල් 28 ක් ද ඇති අතර, සිසුන් 4,810ක් අධ්‍යාපනය හදාරති. ප්‍රදේශයේ ආර්ථික හා සාමාජීය දියුණුව වෙනුවෙන්, පිහිටුවා ඇති ගොවි සංවිධාන 28 ක් ද වැඩිහිටි සංවිධාන 20 ක් ද කාන්තා සංවිධාන 14 ක්ද ග්‍රාම සංවර්ධන සමිති 30 ක්ද යෞවන සමාජ 24 ක්ද සක්‍රිය දායකත්වය ලබා දෙයි.

මීගහකිවුල බල ප්‍රදේශයේ පාලනය මුලින්ම ගම් සභා යටතේ පැවතිය අතර, මීගහකිවුල ගම් සභාවේ සභාපති වශයෙන් කේ.එම්. ගුණසේකර බණ්ඩාර මහතා සහ උප සභාපති වශයෙන්, ඩී.එම්.ඩිංගිරි හාමි මහතා කටයුතු කර ඇති අතර, 1980 දක්වා ගම් සභා ක්‍රමය පැවතුණි. 1980 අංක 35 දරණ සංවර්ධන සභා පණතින් පසුව ගම් සභාව සංවර්ධන සභාව ලෙස 1988 දක්වා ක්‍රියාත්මක වීය.

1987 අංක 15 දරණ ප්‍රදේශීය සභා පණත ක්‍රියාත්මක වීමෙන් අනතුරුව මීගහකිවුල සංවර්ධන සභාව මීගහකිවුල ප්‍රදේශීය සභාව නමින් , 1988 ආරම්භ විය. 1988 පැවති ප්‍රථම පළාත් පාලන මැතිවරණයේදී මීගහකිවුල ප්‍රදේශීය සභා බල ප්‍රදේශයේ බහුතර ජනතාවගේ ඡන්දයෙන් මීගහකිවුල ප්‍රදේශීය සභාවේ ප්‍රථම ගරු සභාපති වශයෙන් එක්සත් ජාතික පක්ෂ නියෝජනය කල ඩී.එම් .අප්පු හාමි මහතා පත් වී ඇති අතර, 1987 ප්‍රදේශීය සභා පනතට අනුව පූර්ණ බලතල සභාපතිවරයෙකුට හිමි විය.මෙම සභාව මන්ත්‍රීවරු 09 දෙනකුගෙන් යුතු මන්ත්‍රී මණ්ඩලයකින් යුත්ත වීය.

ඒ අනුව 1991 පැවති පළාත් පාලන මැතිවරණයෙන්ද බහුතර ජනතාගේ කැමැත්තට අනුව ඩී.එම්. අප්පුහාමි මහතා නැවත සභාපතිවරයා වශයෙන්, පත් වී ඇත. 1988 සිට 1997 දක්වා වූ කාලය තුල මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරය දරමින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා හඳුනා ගනිමින් විශාල සමාජ මෙහෙවරක් ඉටු කර ඇත.

1997.03.16 දින පවත්වන ලද පළාත් පාලන මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂය නැවත ජයග්‍රහනය කරමින් ඩී.බී. ආනන්ද කරුණානායක මහතා ප්‍රාදේශිය සභාවේ දෙවන සභාපති වරයා වශයෙන් පත්වූ අතර, උප සභාපති වශයෙන් ආර්.එම් විජේසුන්දර මහතා පත්වන ලදී. එහිදී ද මන්ත්‍රී මණ්ඩලය නව දෙනකුගෙන් සමන්විත වන ලදී. ඉන් පසු නැවත 2001.03.20 පැවති පළාත් පාලන මැතිවරණයෙන්ද නැවතත් එක්සත් ජාතික පක්ෂය ජයග්‍රාණය කරමින් ඩී.බී. ආනන්ද කරුණානායක මහතා නැවතත් සභාපති ධුරයට පත්වූ අත්ර, එහිදීද මන්ත්‍රී මණ්ඩලය නව දෙනකුගෙන් සමන්විත විය.

නැවත 2006.03.30 දින පවත්වන ලද පළාත් පාලන මැතිවරණයෙන් ජනතාවගේ බහුතර ජන්දයෙන් එක්සත් ජනතා නිදහස් සන්ධානය බලයට පත්වූ අතර, මීගහකිවුල ප්‍රදේශයේ සභාවේ තෙවන සභාපති ධුරය ඩී.එම්. සුමනපාල මහතාට හිමිවිය.එහිදී අප සභාපති වශයෙන් ඩී.එම්.සුමතිපාල උඩල කුඹුර මහතා කටයුතු කළේය. එහිදීද නියෝජිතයින් නව දෙනකුගෙන් සමන්විත වූ අතර, පාලන පක්ෂයේ නියෝජිතයින් හය දෙනකුගෙන්ද විපක්ෂ නියෝජිතයින් තුන් දෙනකුගෙන්ද සමන්විත විය.

අනතුරුව 2011.03.26 දින පැවති පළාත් පාලන මැතිවරණයෙන් නැවත එක්සත් ජනතා නිදහස් සන්ධානය බලයට පත්වූ අතර,එහිදි ප්‍රදේශයේ ජනතාවගේ බහුතර ජන්දයෙන් ගරු සභාපතිවරයා වශයෙන් ඩී.එම්.ජේ.සී.දිසානායක මහතා පත්වූ අතර, උප සභාපති වශයෙන්, එස්.එම්.එල්.එච්.ජයවර්ධන මහතා පත්වීය.පාලන පක්ෂයේ නියෝජිතයින් 06 දෙනකුගෙන් සහ විපක්ෂයේ නියෝජිතයින් 03 දෙනකුගෙන් සමන්විත මන්ත්‍රී මණ්ඩලයක් යටතේ 2015.05.14 දක්වා සභාවේ කටයුතු ක්‍රියාත්මක වීය.

ඉන්පසු 2018.02.10 දින පැවති පළාත් පාලන මැතිවරණයෙන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි එස්.එම්.එල්.එච්. ජයවර්ධන මහතා ගරු සභාපති වශයෙන් පත්වූ අතර, ගරු උප සභාපති වශයෙන් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ, ඩබ්.එම්. සමන්ත කුමාර මහතා පත්වූ අතර, 15 දෙනකුගෙන් සමන්විත මන්ත්‍රී මණ්ඩලයකින් සමන්විත වීය.

1988 ප්‍රාදේශිය සභාව පිහිටු වීමෙන් පසු වර්ථමානය දක්වා ප්‍රධාන පාලන පක්ෂ දෙකක නියෝජිතයින් යටතේ ක්‍රියාත්මක වෙමින් බල ප්‍රදේශයේ සිදු වූ සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳව ආපසු හැරී බැලීමේ දි ප්‍රදේශයේ මහජනතාවගේ සෞඛ්‍ය, අධ්‍යාපනික හා ආර්ථික පහසුකම් වැඩි දියුණු කිරීමේ මංමාවත්, ජල ව්‍යාපෘති හා සති පොළවල් හා පොදු වැසිකිලි පහසුකම් වැඩි දියුණු කරමින්, විශාල සංවර්ධනයකට දායකත්වය ලබා දී ඇති බව පැහැදිලි ය.

ප්‍රදේශයේ ජනතාවගේ හා පාසැල් දරුවන්ගේ දැනුම වැඩි දියුණු කිරීමෙහිලා මීගහකිවුල , පිටමාරුව සහ කළුගහකදුර ආදි වශයෙන් පුස්තකාල තුනක් පවත්වාගෙන යන අතර, දරුවන්ගේ මුල් ළමාවිය සංවර්ධනය කිරීමෙහි ලා පෙර පාසැල් 02 ක් පවත්වාගෙන යමින් අධ්‍යාපනික දියුණුවට විශාල මෙහෙයක් ඉටු කරගෙන යනු ලබයි.

බල ප්‍රදේශයේ ජනතාවගේ පොදු අවශ්‍යතා හඳුනා ගනිමින් එදා සිට අද දක්වා ප්‍රදේශයේ සංවර්ධන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට සියලු මහජන නියෝජිතයින් හා නිලධාරින් මෙන්ම සේවක මණ්ඩලය බැඳි සිටින අතර වර්තමානයේ මෙම ක්‍රියාවලිය මෙහෙය වීම සඳහා 48 කින් යුත් ස්ථිර කාර්යය මණ්ඩලයක් මීගහකිවුල ප්‍රාදේශිය සභාව සමන්විත වේ. වර්තමානයේ මහජන නියෝජිතයින් නොමැති කාල වකවානුවක වුවද මහජනතාවගේ සියළු අවශ්‍යතා ඉටුකිරීමට සහා ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලය නිරතුරුව ම බැදී සිටී.

ලංකාවේ දුප්පත්ම ප්‍රදේශිය ලේකම් කෝට්ඨාශ අතරින්, තෙවන ස්ථානයට ඇති මීගහකිවුල බල ප්‍රදේශය දිළිදු ජනතාවගේ බෝවන රෝග මර්ධනය කිරිම සහ කසල කළමනාකරණය කරමින් සෞඛ්‍ය තත්වය ඉහල නැංවීමටත් පොදු පහසුකම් වැඩි දියුණු කිරීමටත් ප්‍රදේශයේ පාසැල් දරුවන්ගේ අධ්‍යාපන තත්වය ඉහල නැංවීමට සහය වීම තුලින් පාසැල් දරුවන්ගේ අධ්‍යාපනික මට්ටම ඉහල නැංවීමටත් පෙර වර්ෂයන් වලදී මෙන්ම 2023 වර්ෂයේ අයවැය තුළින්ද අපේක්ෂා කරනු ලැබේ.

# 02

# විධායක සාරාංශය

02.1. ගරු සභාපතිතුමාගේ අයවැය පණිවිඩය..............................................04
02.2. ලේකම්තුමියගේ අයවැය පණිවිඩය....................................................06
02.3. ගරු සභාපතිතුමාගේ අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශය..............................07-08
02.4. වර්තමාන සභාපතිතුමා හා මන්ත්‍රී මණ්ඩලය..........................................09

# <u>සභාපතිතුමාගේ අයවැය පණිවිඩය - 2023</u>

මීගහකිවුල ප්‍රාදේශිය සභාවේ වත්මන් ධූර කාලය 2018.04.03 වන දිනෙන් ආරම්භ වීමත් සමඟ පිළිවෙලින් 2019,2020,2021 හා 2022 වර්ෂ සඳහා අයවැය ඉදිරිපත්කර, **2023 වර්ෂය සඳහා පස්වන** අයවැය වාර්තාව ද ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම මා ලද භාග්‍යයක් කොට සලකමි. මීගහකිවුල ප්‍රාදේශිය සභාව අඩු ආදායම් ලාභී පසුගාමී ප්‍රාදේශිය සභාවක් වන අතර, මෙම **අඩු ආදායම් ලාභී යන නාමය** ඉවත් කර ගැනිමට හැකි උපරිම දායකත්වය ලබා දිම මාගේ අභිප්‍රායයි.

වර්තමානය වන විට ශ්‍රී ලංකා ආර්ථිකය ඉතා තිරණාත්මක සංධිස්ථානයකට පැමිණ තිබේ.ඒ සමඟ රාජ්‍ය මුදල් ඉතා වගකිමෙන් සහ පිරිමැස්මෙන් යුතුව පරිහරණය කරමින් මීගහකිවුල බල ප්‍රදේශයේ මානව හා භෞතික සම්පත් වඩාත් ඵලදායි ලෙස හා මනා කළමනාකාරිත්වයෙන් යුතුව සැලසුම් සහගතව, පළාත් පාලන නීතින් තුළ ක්‍රියා කරමින් ප්‍රදේශයේ දරිද්‍රතාවය පිටු දැකීමටත්, සමාජ සාධාරණත්වය සහතික කිරීමටත්, සංවර්ධන සැලසුම් උපාය මාර්ග සකස් කිරීමටත් අන් කවරදාටත් වඩා ප්‍රමුඛතාවයක් ලබා දෙමින් මෙකි කටයුතු සිදු කිරිමට මා කටයුතු කරමි.

2023 වර්ෂයේ අයවැය ලේඛනය පිළියෙල කිරීමේදී ප්‍රාදේශීය සභාවේ උප සභාපතිතුමා, විපක්ෂ නායකතුමා සහ ගරු මන්ත්‍රිතුමන්ලාගේ අදහස් හා මග පෙන්වීම මගින් මා හට බල ප්‍රදේශයේ ක්‍රියාත්මක විය යුතු සංවර්ධන යෝජනා හැර ඊට අදාල දේපලයන්හි සිදු කරනු ලබන අළුත්වැඩියාවන් හා නඩත්තු කටයුතු සඳහා දරණ වියදම් මෙන්ම ආදායම් උත්පාදන මාර්ග පුළුල් කිරිම සම්බන්ධ යෝජනා මගින් සහභාගිත්ව අයවැය ලේඛනයක් සකස්කර ගැනීමට බෙහෙවින් මහෝපකාරි විය.

2023 වර්ෂයේ අයවැය ලේඛනයෙහි සඳහන් ආදායම් ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය පියවර ගනිමින්, නව ආදායම් උත්පාදන මාර්ග නිර්මාණය කර ගැනීමටත් , රේඛිය අමාත්‍යංශය පළාත් පාලන අමාත්‍යංශය පළාත් පාලන දෙපාර්තමේන්තුවේ, ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය හා ආසියානු පදනම වැනි ආයතනයන්හි දායකත්වය මත අපේක්ෂිත සංවර්ධන ඉලක්ක ළඟා කරගැනීමටත් අපේක්ෂා කරමි. **මීගහකිවුල බල ප්‍රදේශයේ උග්‍ර ගැටළුවක්ව පැවති ජල ගැටළුවට පිළියම් ලෙස රු.මිලි. 26 ක් පමණ වියදම් දාරා තාවකාලිකව නවතා දැමූ ජල යෝජනා ක්‍රමය නැවත සක්‍රිය කරමින් ප්‍රදේශවාසී ජනතාවගේ ජීවනාලිය නඟා සිටුවීම ප්‍රමුඛ අරමුණක් වේ.**

2023 වර්ෂයේ අයවැය ලේඛනය සාර්ථක කරගැනීමට ඉතා කැපවීමෙන්, හා උනන්දුවෙන් මා දිරිමත් කරමින්, නිරතුරුවම මා සමග අත්වැල් බැදගත් මීගහකිවුල ප්‍රාදේශිය සභාවේ උප සභාපතිතුමා හා විපක්ෂ නායකතුමා ඇතුළු ගරු මන්ත්‍රි මණ්ඩලයටද මීගහකිවුල ප්‍රාදේශිය සභා පරිපාලනයේදී නිරතුරුවම ගුරුහරුකම් ලබා දෙන සභා ලේකම්තුමිය ඇතුළු මාගේ කාර්යය මණ්ඩලයටද හද පිරි කෘතවේදිත්වය පුද කරමි.

සභාපති,
එස්.එම්.එල්.එච්.ජයවර්ධන,
ප්‍රාදේශිය සභාව,
මීගහකිවුල

සභාපති
එස්.එම්.එල්.එච්.ජයවර්ධන
ප්‍රාදේශීය සභාව මීගහකිවුල

# <u>සභාලේකම්තුමියගේ අයවැය පණිවිඩය - 2023</u>

2023 වර්ෂයට අදාලව මීගහකිවුල ප්‍රාදේශිය සභාවේ වත්මන් ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන **පස්වන අයවැය ලේඛණය** සඳහා අදහස් දැක්වීමට අවස්ථාවක් ලබාදීම සම්බන්ධව මා පළමුවෙන් ම මාගේ හද පිරි ස්තුතිය පුද කරමි.

අභිමානවත් පුරවරයක් යන දැක්ම කරා ගමන් කරන මග ගරු සභාපතිතුමන් විසින් ආර්ථික, සමාජයීය සංවර්ධන ඉලක්කයන් ලගා කර ගැනීම සඳහා ප්‍රාදේශිය සභාවේ ලේකම්වරයා වශයෙන් ඒ සඳහා දායකත්වය ලබා දීමට අවස්ථාව ලැබීම මා ලද භාග්‍යක් කොට සලකමි.

මීගහකිවුල ප්‍රාදේශිය සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා වන ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලය පළාත් පාලන නීතිමය රාමුව තුල බල ප්‍රදේශයට අයත් මහජන සෞඛ්‍ය,පොදු මංමාවත්,මහජන උපයෝගිතා සේවා සහ සුබ සාධන සේවාවන් ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනිමට හා ජනතාවගේ සමාජ, ආර්ථික, සංස්කෘතික සංවර්ධන අභිමාර්ථ ඉටු කිරිම උදෙසා ගනු ලබන ප්‍රයත්තයන් සාර්ථක කර ගැනීම උදෙසා කාර්යක්ෂම හා උපරිම සේවාවක් ලබා දීම මා ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයේ වගකිමක් ලෙස සලකමි.

2023 වර්ෂය සඳහා වන අයවැය ලේඛනය සහභාගිත්ව සැලසුම්කරණය මූලික කොටගෙන ප්‍රාදේශීය බල ප්‍රදේශය තුල ප්‍රධාන අවශ්‍යතා හඳුනාගෙන සමාජ, ආර්ථික, සංස්කෘතික සංවර්ධන ක්‍රියාවළිය යතාර්ථයක් කිරීමට නන් අයුරින් සහයෝගය ලබා දුන් ගරු මන්ත්‍රී මණ්ඩලයටත්, ප්‍රාදේශිය සභාවේ සමස්ථ කාර්යය මණ්ඩලයටත්, මාගේ හද පිරි කෘතවේදිත්වය පුද කරමි.

Kishanthi

සභා ලේකම්,
ඩී.එම්.කේ.ඩී.දිසානායක,
ප්‍රාදේශිය සභාව,මීගහකිවුල

ඩී එම් කේ ඩී දිසානායක
සභා ලේකම්
ප්‍රාදේශිය සභාව මීගහකිවුල

## ගරු සභාපතිතුමාගේ 2023 වර්ෂයේ අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශය.

මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ වත්මන් සභාපතිවරයා වශයෙන්, මාගේ ධුර කාලය තුල පස්වන අයවැය ලේඛණය ඉදිරිපත් කිරීමේදි ගරු මන්ත්‍රී මණ්ඩලයේ සහයෝගය ඇතිව මීගහකිවුල ප්‍රදේශයේ ජනතාවගේ සුභ සාධනය උදෙසා මහජන සෞඛ්‍ය, පොදු මංමාවත්, පොදු උපයෝගිතා සේවා වැඩි දියුණු කිරීම සඳහා පහත සඳහන් යෝජනා 2023 වර්ෂයෙහි අයවැය සකස් කිරීමට පදනම් කර ගන්නා ලදී .

2023 වර්ෂයේ අයවැය සකස් කිරීම සඳහා අදාල රීති ප්‍රකාරව කටයුතු කල අතර, රාජ්‍ය වියදම් පාලනය කිරීම මැයෙන් භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 3/2022 කෙරෙහි අවධානය යොමු කරමින් අභියෝගාත්මක අයවැයක් සකස් කිරීම ඉතා දුෂ්කර විය.වර්තමානයේ පවතින අභියෝගකාරි වතාවරණය පාලනය කරගැනීම සඳහා රාජ්‍ය ආදායම පාලනය වර්ධනය කර ගැනීම ප්‍රමුඛ අවශ්‍යතාවයක් වන අතර ඒ සඳහා යම් කාලයක් ගතවන බැවින් එතෙක් රාජ්‍ය වියදම ඉතාම අත්‍යාවශ්‍යය සේවාවන් සඳහා පමණක් යොදා ගැනීමට හැකිවන පරිදි දැඩිව පාලනය කිරීමට සිදුව තිබේ. ඒ අනුව ඊට අනුගත වෙමින් නව සංවර්ධන ව්‍යාපෘති හැර 2023 වර්ෂය තුළදි ළඟා කරගැනීමට අපේක්ෂිත ඉලක්ක කිහිපයක් මතු සඳහන් කරමි.

ඒවා නම්,

- පූංචි ලෝකාන්තය, ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ නව දුරටත් සංචාරක ආකර්ශණය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම තුළින් සභාවේ ආදායම ඉහල නැංවීමට කටයුතු කිරීම.

- මීගහකිවුල බල ප්‍රදේශයට දීර්ඝ කාලීනව ගැටලුවක්ව පැවති පානිය ජලය හිග කමට විසඳුමක් ලබන වසර තුළදී ලබාදීමට කටයුතු කිරීම.

- කරමැටිය සතිපොළ, පිටමාරුව සතිපොළ සහ මීගහකිවුල නව බස් නැවතුම්පොළ පරිශ්‍රයෙහි කඩ කාමර 12 ක් ඉදිකිරීම තුළින්, ස්වයං උත්පාදන ආදායම වැඩි කර ගැනීමට කටයුතු සිදු කිරීම සහ මීගහකිවුල නව බස් නැවතුම්පොළේ පහල මහලේ පවත්නා කඩ කාමර බදු දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

- මීගහකිවුල ප්‍රාදේශීය සභා භූමියේ ඉදිකරන ලද කිරිහල තුළින් ජනතාවට සෞඛ්‍ය ආරක්ෂිතව කිරි සහ ආහාර ලබාදීමට කටයුතු කර, එමඟින් ආදායම ඉහල නංවාගැනීමට කටයුතු සිදු කිරීම.
- 2023 වර්ෂයේදී මීගහකිවුල, තල්දෙන, පිටමාරුව, කරමැටිය යන ගම්මාන දියුණු ගම් ප්‍රදේශයන් බවට පත් කිරීම තුළින්, එම ප්‍රදේශ වරිපනම් කලාප බවට පත් කිරීම.
- කරමැටිය ඇගළුම් කර්මාන්ත ශාලාවෙන් ජනනය වන කසළ බැහැර කරලීම සඳහා දායක වීම තුළින් ආදායම් ප්‍රවර්ධනය කරගැනීමට කටයුතු කිරීම.
- කරමැටිය පොළ අසළ කඩ කාමර ටෙන්ඩර් ලබා දීම.
- ලොග්ගල්ලා ඔය ජලාශය අසල උද්‍යානයක් සෑදීම.
- මහජන ආධාර ලබා දීම.

# මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති තුමා උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලය



(පිළිවෙළින්,ගරු සභාපති එස්.එම්.එල්.එච්.ජයවර්ධන මැතිතුමා, ගරු උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා, ගරු මන්ත්‍රී එසඑම්.රංගන මධුමාල් මැතිතුමා ,ගරු මන්ත්‍රී කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා, ගරු මන්ත්‍රී සුමතිපාල උඩලකුඹුර මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියාලතා මැතිණිය, ගරු මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී.එම්.එසඨාමාවති මැතිණිය, ගරු මන්ත්‍රී ආර්.එම්.නිශාදි ශිරන්තිකා මැතිණිය, ගරු මන්ත්‍රී කේ.පි.බාලසුන්දරම් මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී.එම්.රත්නතිස්ස මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා,ගරු මන්ත්‍රී නන්දන සම්පත් උදය කුමාර මැතිතුමා, ගරුමන්ත්‍රී ඩී.එම්.චමින්ද ප්‍රදීප් මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී.එම්.මංජුල දිසානායක මැතිතුමා,ගරු මන්ත්‍රී ඩී.එම් පත්මා කුමාරි මැතිණිය,ගරු මන්ත්‍රී ආර්.එම්.නාමල් රත්නායක මැතිතුමා)

# 03

# අප පිළිබඳව

03.1. පොදු තොරතුරු........................................................................11-13
03.2. බල ප්‍රදේශයේ සිතියම...................................................................14
03.3. සංවිධාන සටහන...........................................................................15
03.4. මිනිස් බල සාරාංශය...................................................................16-17

## මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ පොදු තොරතුරු

### 01. සංඛ්‍යා ලේඛන

- ❖ පළාත - ඌව පළාත
- ❖ දිස්ත්‍රික්කය - බදුල්ල
- ❖ මැතිවරණ කොට්ඨාශය - වියළුව
- ❖ ප්‍රාදේශීයලේකම් කාර්යාලය - මීගහකිවුල
- ❖ ග්‍රාම නිළධාරි වසම් ගණන - 20
- ❖ බල ප්‍රදේශය විශාලත්වය - $105km^2$
- ❖ ජනගහනය - 25,122
- ❖ සේවක සංඛාව (ස්ථිර) - 48
- ❖ දුරකථන අංකය / ෆැක්ස් අංකය - 055-2245775
- ❖ ඊ-මේල් - meegahakiulaps@gmail.com
- ❖ ජල පාරිභෝගික සංඛ්‍යාව - 541

### 02. සේවා සපයන ස්ථාන

- ❖ සුසාන භූමි - 17
- ❖ සති පොළ - 04
- ❖ පොදු වැසිකිළි - 05
- ❖ පොදු ළිං හා පිහිළි - 27
- ❖ පුස්තකාල - 03
- ❖ ප්‍රජා ශාලා - 06
- ❖ ළදරු පෙර පාසැල් - 28
- ❖ කිරිහල - 01

### 03. ආගමික ස්ථාන

- ❖ පන්සල් - 19
- ❖ කෝවිල් - 04

### 04. පාසැල් ගණන

- ❖ ජාතික පාසැල් - 01
- ❖ මහා විද්‍යාලය - 12
- ❖ ප්‍රාථමික විද්‍යාලය - 09

## 05.රජයේ රෝහල්

- ❖ දිසා රෝහල් - 01
- ❖ ග්‍රාමීය රෝහල් - 01

## 06.තැපැල් කාර්යාල

- ❖ උප තැපැල් කාර්යාල - 05

## 07. බැංකු

- ❖ රාජ්‍ය බැංකු - 03
- ❖ ග්‍රාමීය බැංකු - 03
- ❖ සමෘද්ධි බැංකු - 02
- ❖ ප්‍රජා ශක්ති සංවර්ධන බැංකු - 01
- ❖ වෙනත් රාජ්‍ය ආයතන - 09

## 08. සංචාරක ස්ථාන

- ❖ පුංචි ලෝකාන්තය - පිටමාරුව - 01

## 09. වාහන

- ❖ WP PF- 5485 කැබ් රථය
- ❖ 252-6368 කැබ් රථය
- ❖ RD - 6200 ට්‍රැක්ටරය
- ❖ UP RB -999 ට්‍රැක්ටරය
- ❖ WP RD 9389 ට්‍රැක්ටරය
- ❖ 270-1735 ට්‍රැක්ටරය
- ❖ HAMM/HD&VV රෝලය
- ❖ පා පැදිය
- ❖ WP UA- 9818 යතුරු පැදිය
- ❖ PPRW - 5317 ජල බවුසරය
- ❖ PPAW - 4097 ජල බවුසරය
- ❖ RX -1456ජල බවුසරය
- ❖ WP LL - 6984 ටිපර් රථය
- ❖ WP ZA - 5003 බැකෝ ලෝඩරය
- ❖ WPLL - කෘ කැබ් රථය

## 10. වත්කම්

- ❖ කාර්යාල ගොඩනැගිල්ල
- ❖ මීගහකිවුල බස් නැවතුම් පොළ
- ❖ බතලවත්ත ප්‍රජා ශාලා ගොඩනැගිල්ල
- ❖ කැටවත්ත ප්‍රජා ශාලා ගොඩනැගිල්ල
- ❖ පොල් ගහ අරාව ප්‍රජා ශාලා ගොඩනැගිල්ල
- ❖ ගොඩයාගම ප්‍රජා ශාලා ගොඩනැගිල්ල
- ❖ මීගහකිවුල ප්‍රජා ශාලා ගොඩනැගිල්ල
- ❖ පිටමාරුව පුස්තකාල ගොඩනැගිල්ල
- ❖ කළුගහකදුර පුස්තාල ගොඩනැගිල්ල
- ❖ තල්දෙන ප්‍රජා ශාලාව
- ❖ ගල්ගේ ලන්ද ප්‍රජා ශාලාව
- ❖ මීගහකිවුල සති පොළ ගොඩනැගිල්ල
- ❖ පිටමාරුව සති පොළ ගොඩනැගිල්ල
- ❖ කරමැටිය සති පොළ ගොඩ නැගිල්ල
- ❖ ඩොලමයිට් ව්‍යාපෘතිය සඳහා ඉදි කල ගොඩනැගිල්ල

## 11 ඉඩම්

- ❖ මීගහකිවුල පොල්වත්ත ඉඩම
- ❖ ප්‍රධාන කාර්යාල ඉඩම
- ❖ පිටමාරුව සති පොළ ඉඩම
- ❖ තල්දෙන සති පොළ ඉඩම
- ❖ මීගහකිවුල සති පොළ පිහිටි ඉඩම
- ❖ කරමැටිය ආයුර්වේද අසල ඉඩම
- ❖ 13 කණුව අක්කර 01 ක ඉඩම
- ❖ අකුරු කඩුව කොස්මෝ ෆාම්හි ඉඩම
- ❖ බෝගහතැන්න සති පොළ ඉඩම


## 12. කඩ කාමර

| | | |
|---|---|---|
| ❖ මීගහකිවුල නගරයේ කඩ කාමර | - | 22 |
| ❖ මීගහකිවුල බස්නැවතුම්පල කඩ කාමර (ඉහල මහල) | - | 08 |
| ❖ මීගහකිවුල බස්නැවතුම්පල කඩ කාමර (පහල මහල) | - | 04 |

# බල ප්‍රදේශයේ සිතියම

## Ward Map of Meegahakivula Pradeshiya Sabha - Badulla District

Ref. No : NDC / 22 / 07








| Meegahakivula Pradeshiya Sabha | |
|---|---|
| WARD No | WARD Name |
| 1 | Balagolla |
| 2 | Karandagahamada |
| 3 | Meegahakivula |
| 4 | Akurukaduwa |
| 5 | Kalugahakandura |
| 6 | Roberiya |
| 7 | Pitamaruwa |
| 8 | Ketawatta |
| 9 | Kohana |
| 10 | Thaldena |

Legend
- Province Boundary
- District Boundary
- DS Boundary
- GN Boundary
- Polling Division Boundary
- PS Boundary
- MC / UC Boundary
- Ward Boundary
- Multi Member Ward

Prepared by Survey Department of Sri Lanka

Data Source:
National Delimitation Committee for Local Authorities - 2013
Ministry of Local Government and Provincial Councils

# මිගහකිවුල ප්‍රාදේශීය සභාවේ සංවිධාන සටහන



# කාර්ය මණ්ඩල තොරතුරු

| අනු අංකය | තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|---|
| 1 | සභාලේකම් | 1 | 1 | 0 | |
| 2 | සංවර්ධන නිලධාරි (iii) | 8 | 8 | | |
| 3 | කාර්මික නිළධාරි | 1 | 1 | | |
| 4 | කාර්මික නිළධාරි (පුහුණු) | | 1 | | 1 |
| 6 | පුස්තකාලාධිපති | 1 | 0 | 1 | |
| 7 | කළමනාකරණ සහකාර | 4 | 4 | 0 | |
| 8 | ආදායම් පරිපාලක | 1 | 1 | 0 | |
| 9 | වැඩ පරිපාලක | 1 | 1 | 0 | |
| 10 | පෙර පාසල් ගුරු | 1 | 0 | 1 | |
| 11 | රියදුරු | 2 | 2 | 0 | |
| 12 | විදුලි කාර්මික | 1 | 1 | 0 | |
| 13 | කාර්යාල කාර්ය සහායක | 2 | 2 | 0 | |
| 14 | පුස්තකාල සහායක | 3 | 2 | 1 | |
| 15 | මුරකරු | 2 | 2 | 0 | |
| 16 | මාර්ග කම්කරු/ක්ෂේත්‍ර කම්කරු | 13 | 13 | 0 | |
| 17 | සෞඛ්‍ය කම්කරු | 6 | 6 | 0 | |
| 18 | යන්ත්‍ර ක්‍රියාකරු | | 1 | | 1 |
| 19 | යන්ත්‍ර සහයක | | 2 | | 2 |
| | එකතුව | 47 | 47 | 3 | 4 |

# කාර්ය මණ්ඩල වැටුප් කාණ්ඩය

| අනු අංකය | තනතුර | වැටුප් කාණ්ඩය |
|---|---|---|
| **01.** පොදු පරිපාලනය | | |
| 1 | කළමනාකරණ සහකාර අධි ශ්‍රේණිය | 41580-11X755-18x1030-68425 |
| 2 | කළමනාකරණ සහකාර i/ii/iii | 28940-10x300-11X350-10x560-10X660-47990 |
| 3 | වැඩ සටහන් සහකාර/සංවර්ධන නිළධාරි | 31490-10X445-11X660-10X730-5X750-54250 |
| 4 | කාර්මික නිළධාරි | 31040-10X445-11x660-10X730-10x750-57550 |
| 5 | ආදායම් පරිපාලක | 27140-10X300-11X350-10X495-10X660-45540 |
| 6 | රියදුරු | 25250-10X270-10x300-10x330-12X350-38450 |
| 7 | විදුලි කාර්මික | 25250-10X270-10X300-10X330-12x350-38450 |
| 8 | කාර්යාල කාර්ය සහායක | 24250-10x250-10X270-10X300-12x330-36410 |
| 9 | මුරකරු | 24250-10x250-10X270-10X300-12X330-36410 |
| **02.**සෞඛ්‍ය සේවා | | |
| 10 | වැඩ පරිපාලක | 27140-10X300-11X350-10X495-10X660-45540 |
| 11 | සෞඛ්‍ය කම්කරු | 24250-10x250-10X270-10X300-12X330-36410 |
| **03.**භෞතික සැලසුම්,මංමාවත් හා ගොඩනැගලි | | |
| 13 | මාර්ග කම්කරු | 24250-10x250-10X270-10X300-12X330-36410 |
| **04.**ජල සේවා | | |
| | | |
| **05.**වෙනත් පොදු උපයෝගිතා සේවා | | |
| | | |
| **06.**සුභසාධන සේවා | | |
| 14 | පුස්තකාලාධිපති | 31040-10X445-11x660-10X730-10x750-57550 |
| 15 | පුස්තකාල සහායක | 24250-10x250-10X270-10X300-12X330-36410 |

# 04

# 2023 වර්ෂයේ

# අයවැය


04.1. ආදායම් හා වියදම් පසුගිය වර්ෂ දෙක සමග සංසන්දනය................19-22
04.2. පුනරාවර්ථන /ප්‍රාග්ධන/ ආදායම් සාරාංශ.........................................23
04.3. පුනරාවර්ථන /ප්‍රාග්ධන ආදායම් සාරාංශය වට ප්‍රස්තාර.......................24
04.4. පුනරාවර්ථන /ප්‍රාග්ධන/ වියදම් සාරාංශ............................................25
04.5. පුනරාවර්ථන /ප්‍රාග්ධන වියදම් සාරාංශය වට ප්‍රස්තාර.........................26
04.6. පුනරාවර්ථන ආදායම් වියදම්/ ප්‍රාග්ධන ආදායම් වියදම් ඇතුළු
අතිරික්තය/ඌණතාවය පෙන්වනු ලබන සාරාංශය.................................
04.7. අය වැය වාර්තාව.................................................................27-39
04.8. අය වැය වර්ෂයට ඇස්තමේන්තු සකසන ආකාරය
පිළිබඳව හැඳින්වීම..........................................................40-52
04.9.අයවැය සම්මත කිරීම් ලිපිය.........................................................53

## 2020/2021 වර්ෂයේ සත්‍ය ආදායම් හා 2023 වර්ෂයේ ඇස්තමේන්තු ආදායම්

| අය ශීර්ෂය | විස්තරය | 2020 වර්ෂයේ සත්‍ය ආදායම (රුපියල්) | 2021 වර්ෂයේ සත්‍ය ආදායම (රුපියල්) | 2023 වර්ෂයේ අස්තමේන්තු මුදල (රුපියල්) |
|---|---|---|---|---|
| 10 | වරිපනම් හා බදු | 1,589,921.00 | 4,189,252.60 | 3,134,000.00 |
| 20 | කුලි | 3,842,917.84 | 1,102,472.00 | 5,164,400.00 |
| 30 | බල පත්‍ර | 451,222.50 | 431,402.50 | 751,000.00 |
| 40 | සේවා සදහා ගාස්තු | 1,179,578.38 | 4,044,571.68 | 3,398,000.00 |
| 50 | වරෙන්තු ගාස්තු හා දඩ | 3,009,482.50 | 3,017,410.41 | 1,552,000.00 |
| 60 | වෙනත් ආදායම් | 2,237,523.73 | 1,945,473.97 | 1,951,000.00 |
| 70 | ආදායම් ආධාර | 21,381,662.04 | 23,828,924.43 | 29,686,900.00 |
| 80 | ප්‍රාග්ධන ආධාර | 5,911,672.37 | 6,421,898.35 | 1,513,000.00 |
| | මුළු වියදම | **39,603,980.36** | **44,981,405.94** | **47,150,300.00** |

## 2020/2021 වර්ෂයේ සත්‍ය ආදායම් හා 2023 වර්ෂයේ ඇස්තමේන්තු ආදායම් ප්‍රතිශතය

| අය ශීර්ෂය | විස්තරය | 2020 වර්ෂයේ සත්‍ය ආදායම් ප්‍රතිශතය (%) | 2021 වර්ෂයේ සත්‍ය ආදායම් ප්‍රතිශතය (%) | 2023 වර්ෂයේ ඇස්තමේන්තු ආදායම් ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| 10 | වරිපනම් හා බදු | 4.01 | 9.31 | 6.65 |
| 20 | කුලි | 9.70 | 2.45 | 10.95 |
| 30 | බල පත්‍ර | 1.14 | 0.96 | 1.59 |
| 40 | සේවා සදහා ගාස්තු | 2.98 | 8.99 | 7.21 |
| 50 | වරෙන්තු ගාස්තු හා දඩ | 7.60 | 6.71 | 3.29 |
| 60 | වෙනත් ආදායම් | 5.65 | 4.33 | 4.14 |
| 70 | ආදායම් ආධාර | 53.99 | 52.98 | 62.96 |
| 80 | ප්‍රාග්ධන ආධාර | 14.93 | 14.28 | 3.21 |
| | මුළු වියදම | **100.00** | **100.00** | **100.00** |


2020/2021/වර්ෂයේ සත්‍ය ආදායම් හා 2023 වර්ෂයේ ඇස්තමේන්තු ආදායම් ප්‍රතිශත සන්සන්දනය
70.00
60.00
50.00
40.00
30.00
20.00
10.00
2020 වර්ෂයේ සත්‍ය ආදායම් ප්‍රතිශතය(%)
2021 වර්ෂයේ සත්‍ය ආදායම් ප්‍රතිශතය(%)
2023 වර්ෂයේ ඇස්තමේන්තු ආදායම් ප්‍රතිශතය(%)
10 20 30 40 50 60 70 80


## 2020/2021 වර්ෂයේ සත්‍ය වියදම් හා 2023 වර්ෂයේ ඇස්තමේන්තු වියදම්

| වැය ශීර්ෂය | විස්තරය | 2020 වර්ෂයේ සත්‍ය වියදම (රුපියල්) | 2021 වර්ෂයේ සත්‍ය වියදම(රුපියල්) | 2023 වර්ෂයේ ඇස්තමේන්තු මුදල (රුපියල්) |
|---|---|---|---|---|
| 101 | වැටුප් හා දීමනා | 24,653,269.98 | 26,135,058.18 | 33,159,999.16 |
| 102 | ගමන් වියදම් | 618,335.00 | 576,856.00 | 450,000.00 |
| 103 | සැපයුම් හා උපකරණ | 2,661,542.13 | 3,934,302.46 | 4,038,750.00 |
| 104 | ප්‍රාග්ධන වත්කම් අ/ වැ/ හා /න | 2,072,777.93 | 2,359,577.76 | 5,112,250.00 |
| 105 | ප්‍රවාහන සම්බන්ධතා | 775,456.54 | 901,835.90 | 1,390,000.00 |
| 106 | පොළී ගෙවීම් | 87,005.45 | 22,000.00 | 100,000.00 |
| 107 | ආධාර මුදල් හා සහනාධාර | 1,506,121.80 | 1,365,000.00 | 2,352,500.00 |
| 108 | විශ්‍රාම වැටුප් ප්‍ර/හා පාරිතෝෂිත | 196,359.89 | 238,319.79 | 545,004.88 |
| 109 | ප්‍රාග්ධන වියදම් | 5,571,691.20 | 6,590,297.15 | - |
| | එකතුව | 38,142,559.92 | 42,123,247.24 | 47,148,504.04 |

## 2020/2021 වර්ෂයේ සත්‍ය වියදම් හා 2023 වර්ෂයේ ඇස්තමේන්තු වියදම් ප්‍රතිශතය

| වැය ශීර්ෂය | විස්තරය | 2020 වර්ෂයේ සත්‍ය වියදම් ප්‍රතිශතය(%) | 2021 වර්ෂයේ සත්‍ය වියදම් ප්‍රතිශතය(%) | 2023වර්ෂයේ ඇස්තමේන්තු ප්‍රතිශතය(%) |
|---|---|---|---|---|
| 101 | වැටුප් හා දීමනා | 64.63 | 62.04 | 70.33 |
| 102 | ගමන් වියදම් | 1.62 | 1.37 | 0.95 |
| 103 | සැපයුම් හා උපකරණ | 6.98 | 9.34 | 8.57 |
| 104 | ප්‍රාග්ධන වත්කම් අළු/ හා නඩ. | 5.43 | 5.60 | 10.84 |
| 105 | ප්‍රවාහන සම්බන්ධතා | 2.03 | 2.14 | 2.95 |
| 106 | පොළී ගෙවීම් | 0.23 | 0.05 | 0.21 |
| 107 | ආධාර මුදල් හා සහනාධාර | 3.95 | 3.24 | 4.99 |
| 108 | විශ්‍රාම වැ/ ප්‍ර/ පාරිතෝෂිත | 0.51 | 0.57 | 1.16 |
| 109 | ප්‍රාග්ධන වියදම් | 14.61 | 15.65 | - |
| | එකතුව | 100.00 | 100.00 | 100.00 |

## 2020/2021/වර්ෂයන්හි සත්‍ය වියදම් හා 2023 වර්ෂයෙහි ඇස්තමේන්තු වියදම් ප්‍රතිශත සන්සන්දනය



## ආදායම් සාරාංශය


| අනු අංකය | විස්තරය | 01 පොදු පරිපාලනය | 02 සෞඛ්‍ය සේවා | 03 භෞතික සැලසුම් | 04 ජල සේවා | 05 පොදු උපයෝගිතා සේවා | 06 සුභ සාධන සේවා | එකතුව(රුපියල්) | ප්‍රතිශතය% |
|---|---|---|---|---|---|---|---|---|---|
| 10 | වරිපනම් හා බදු | 334,000.00 | 100,000.00 | - | 1,600,000.00 | - | 1,100,000.00 | **3,134,000.00** | **6.65** |
| 20 | කුලී | - | 250,000.00 | 1,811,400.00 | - | 3,100,000.00 | 3,000.00 | **5,164,400.00** | **10.95** |
| 30 | බලපත්‍ර | 250,000.00 | 501,000.00 | - | - | - | - | **751,000.00** | **1.59** |
| 40 | සේවා සඳහා ගාස්තු | 765,000.00 | 30,000.00 | 2,500,000.00 | 103,000.00 | - | - | **3,398,000.00** | **7.21** |
| 50 | වරෙන්තු ගාස්තු හා දඩ | 1,500,000.00 | - | 10,000.00 | 7,000.00 | 20,000.00 | 15,000.00 | **1,552,000.00** | **3.29** |
| 60 | වෙනත් ආදායම් | 1,800,000.00 | 20,000.00 | 5,000.00 | 1,000.00 | 5,000.00 | 120,000.00 | **1,951,000.00** | **4.14** |
| 70 | ආදායම් ආධාර | 14,664,640.00 | 4,579,680.00 | 8,362,680.00 | - | - | 2,079,900.00 | **29,686,900.00** | **62.96** |
| 80 | ප්‍රාග්ධන ආධාර | 5,000.00 | 3,000.00 | 800,000.00 | 500,000.00 | 5,000.00 | 200,000.00 | **1,513,000.00** | **3.21** |
| | එකතුව | **19,318,640.00** | **5,483,680.00** | **13,489,080.00** | **2,211,000.00** | **3,130,000.00** | **3,517,900.00** | **47,150,300.00** | **100.00** |

| | |
|---|---|
| ආදායම් | **47,150,300.00** |
| වියදම් | **47,148,504.04** |
| අතිරික්තය/ඌනතාවය | **1,795.96** |

**2023 වර්ෂයේ**

**ඇස්තමේන්තු ආදායම්සාරාංශය**

| අය ශීර්ෂය | විස්තරය | එකතුව | ප්‍රතිශතය% |
|---|---|---|---|
| 10 | වරිපනම් හාබදු | 3,134,000.00 | 6.65 |
| 20 | කුලී | 5,164,400.00 | 10.95 |
| 30 | බලපත්‍ර | 751,000.00 | 1.59 |
| 40 | සේවාසදහා ගාස්තු | 3,398,000.00 | 7.21 |
| 50 | වරෙන්තුගාස්තු හා දඩ | 1,552,000.00 | 3.29 |
| 60 | වෙනත්ආදායම් | 1,951,000.00 | 4.14 |
| 70 | ආදායම්ආධාර | 29,686,900.00 | 62.96 |
| 80 | ප්‍රාග්ධනආධාර | 1,513,000.00 | 3.21 |
| | එකතුව | **47,150,300.00** | **100.00** |



## වියදම් සාරාංශය


| අනු අංකය | විස්තරය | 01 පොදු පරිපාලනය | 02 සෞඛ්‍ය සේවා | 03 භෞතික සැලසුම් | 04 ජල සේවා | 05 පොදු උපයෝගිතා සේවා | 06 සුභ සාධන සේවා | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|
| 101 | වැටුප් හා දීමනා | 16,593,440.00 | 5,748,979.16 | 8,497,680.00 | - | - | 2,319,900.00 | **33,159,999.16** | **70.33** |
